# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1740/22 - 2012 ජනවාරි 13 වැනි සිකුරාදා - 2012.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අක 39.

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

10(1)(ආ)(ii) වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කටයුතු කරමින්, දේශීයව නිෂ්පාදිත පහත සඳහන් එළවළු හා පළතුරු රැස් කිරීමේදී, ගබඩා කිරීමේ දී හා ප්‍රවාහනය කිරීමේ දී ප්ලාස්ටික් හෝ ඝන කඩදාසි හෝ දැව වලින් සකසා ඇති ඇසුරුම් භාවිතා කළ යුතු බවත් සියළු දේශීය එළවළු සහ පළතුරු ප්‍රවාහනය කරන්නන්, බෙදාහරින්නන් හා වෙළෙන්දන් වෙත මෙයින් විධාන කරනු ලැබේ.

| පොදු නාමය | උද්භිද විද්‍යාත්මක නාමය |
|---|---|
| තක්කාලි | *Lycopersicon esculentum* |
| තිබ්බටු | *Solanum indicum* |
| කැරට් | *Daucus carota* |
| කරවිල | *Momordica charantia* |
| තුඹකරවිල | *Momordica diocia* |
| මල්ගෝවා | *Brassica oleracea var. botrytis* |
| බෙල් පෙපර් | *Capsicum sp.* |
| සලාද කොළ | *Lactuca sativa* |
| නිවිති | *Spinacia oleracea* |
| මාළු මිරිස් | *Capsicum annum* |
| පිපිඤ්ඤා | *Cucumis sativus* |
| පැපොල් | *Carica papaya* |
| පේර | *Psidium guajara* |
| අලිගැටපේර | *Persia Americana* |

1A - G 15555— 485 (2012/01)

| පොදු නාමය | උද්භිද විද්‍යාත්මක නාමය |
|---|---|
| දොඩම් | *Citrus sp.* |
| දෙළුම් | *Punica granatum* |
| මිදි | *Premna serratifolia* |
| පෙයාස් | *Pyrus communis* |
| මැංගුස් | *Garcinia mangostana* |
| ස්ට්‍රොබෙරි | *Pragarid ananassa* |
| පැෂන්ෆෲට් | *Fassiflora edulis* |

මෙම විධානය 2012 ජනවාරි මස 15 වැනි දින සිට බල පැවැත්වෙනු ඇත.

තවද 2011 ඔක්තෝබර් මස 17 වැනි අංක 1728/5 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 38 දරන විධානය මෙයින් අවලංගු කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2012 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

01-780

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.